මිනු/මාරපොල ප්‍රාථමික විද්‍යාලය - වල්පිටමුල්ල

# පරිසරය - 3 ශ්‍රේණිය

# <u>ගමනාගමනය - Transport</u>

**කලාපය : මිනුවන්ගොඩ**
**අධීක්ෂණය : එම්. එස්. යු. හේවාතිලක මිය (විදුහල්පති)**
**පාඩම සැකසුම : අමලා අතාවුද මිය**

---

❖ <u>පාසල අවට මාර්ගය විහිදී ඇති ආකාරය</u>




01) ඉහත සැලැස්ම අනුව පාසලේ සිට තැපැල් කාර්යාලයට යන මාර්ගය ඊතල යොදමින් ලකුණු කරන්න.

02) තැපැල් කාර්යාලයේ සිට පාසලට යන ආකාරය ලියන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

❖ **අපට දක්නට ලැබෙන විවිධ මාර්ග**

- තාර පාර
- ගුරු පාර
- අඩි පාර
- අධිවේගී මාර්ගය
- කොන්ක්‍රීට් කළ පාර





❖ **සිසුන් දිනපතා පාසලට එන ආකාර**

- පයින්
- බස්රියෙන්
- පාසල් වෑන් රථයෙන්
- යතුරු පැදියෙන්
- ත්‍රීරෝද රථයෙන්
- මෝටර් රථයෙන්






❖ **ඔබේ නිවසේ සිට පාසලට එන මාර්ගය අඳින්න.**

❖ **පයින් ගමන් කරන්නන් විසින් පිළිපැදිය යුතු නීති රීති.**

1) පාරේ දකුණු පැත්තෙන් ගමන් කිරීම.
2) පාර මාරුවීමට කහ ඉර/සුදු ඉර භාවිතා කිරීම.
3) රංචු වශයෙන් පාරේ ගමන් නොකිරීම.
4) අන් අයට කරදර නොවනසේ ගමන් කිරීම.

❖ <u>පාර මාරුවීමේදී නිවැරදි ආකාරය</u>

පළමුව දකුණ බලන්න.

දෙවනුව වමත්, නැවත දකුණත් බලන්න.

වාහන නොමැති නම් ඉක්මනින්ම පාර මාරු වෙන්න.

දකුණ බලා වම බලන්න

නැවතත් දකුණ ම බලන්න

පාරේ වාහන නැත්නම්

ඉක්මනින් ම මාරු වෙන්න

❖ <u>**ගමනාගමනයේ දී අප විසින් කළ යුතු නොකළ යුතු දේ.**</u>

| කළ යුතු දේ | නොකළ යුතු දේ |
|---|---|
| • දකුණුපසින් ගමන් කිරීම.<br>• මාර්ග නීති අනුගමනය කිරීම.<br>• පොදු වාහන ආරක්ෂා කිරීම.<br>• පොදු ප්‍රවාහන සේවයක දී ප්‍රවේශ පත් මිල දී ගැනීම.<br>• විනීතව හැසිරීම. | • රංචු වශයෙන් ගමන් කිරීම, වම් පැත්තෙන් ගමන් කිරීම.<br>• පාරවල්වලට අපද්‍රව්‍ය දැමීම.<br>• මාර්ග නීතිවලට අවනත නොවීම.<br>• පොදු වාහනවලට හානි කිරීම.<br>• අන් අයට කරදර වන ලෙස හැසිරීම. |

❖ **වාහන භාවිතයේ දී සිදු කරන අයහපත් හැසිරීම් හා ක්‍රියා.**

1) වාහනයේ නළාව අධික ශබ්දයෙන් හැඬවීම.
2) අහිතකර දුම් පරිසරයට මුදා හැරීම.
3) තමන්ට නියමිත මංතීරුවේ ගමන් නොකිරීම.
4) පදිකයන්ට අනතුරු වන ආකාරයෙන් වාහන හැසිරවීම.
5) අන් අයට අනතුරු සිදුවන ආකාරයෙන් අධික වේගයෙන් රිය පැදවීම.

❖ **දුම්රිය මාර්ගයක හා මහා මාර්ගයක ඇති වෙනස්කම්.**

| දුම්රිය මාගර්ය | මහා මාර්ගය |
|---|---|
| • කොන්ක්‍රීට් කණු හා පීලි යොදා ඇත.<br>• දුම්රිය පමණක් ගමන් කරයි.<br>• මිනිසුන්ට දුම්රිය මාර්ගයට ඇතුල්වීම තහනම් ය. | • තාර, කොන්ක්‍රීට්, බොරලුවලින් සාදා ඇත.<br>• දුම්රිය හැර ගොඩබිම ගමන් කරන අනෙකුත් සියලු වාහන ගමන් කරයි.<br>• මිනිසුන්ට පයින් ගමන් කළ හැකිය. |

❖ **වාහනවලින් නිකුත් කරන සංඥා.**



ප්‍රධාන ලාම්පු



නවතා තැබීමේ ලාම්පු



සංඥා ලාම්පු



වමට හැරවීම



දකුණට හැරවීම



පසුපසට ගැනීම

❖ **ආසන්න පරිසරයේ පාරවල දක්නට ලැබෙන සංඥා හා සලකුණු.**



පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙනි



වාහන නැවැත්වීම තහනම්



නලා ශබ්ද කිරීම තහනම්



බස්රථ නැවතුම

❖ **විවිධ වාහන**

| ගොඩබිම ගමන් කරන වාහන | අහසේ ගමන් කරන වාහන | දියෙහි ගමන් කරන වාහන |
|---|---|---|
| | | |

ඔබ දන්නා වාහන ඇසුරෙන් ඉහත වගුව පුරවන්න.

- **ඉහත වාහන ඇසුරෙන් එක් වර්ගයකින් ඔබ කැමති එක් වාහනයක් බැගින් තෝරා ගෙන පහත දැක්වෙන තොරතුරු සොයා ලියන්න.**

    1. රෝද සංඛ්‍යාව
    2. ගමන් කරන මාර්ගය
    3. හැඩය
    3. බඩු/මගීන් ගෙන යන මාර්ගය
    4. ප්‍රවේශ පත්‍ර නිකුත් කරන මාර්ගය

- **ඔබ කැමති වාහනයක ආකෘතියක් සාදන්න.**

❖ **මහමග ගමන් කිරීම හා වාහන පරිහරණය පිළිබඳ පහත කවි ගී ගායනා කරන්න.**

උදෑසන ම පොඩි අපි දිව යනවා
කොහේ ද සැඟවී එළියට එනවා
උදේ පාන්දර පාසල් යන්නට
බසයක් ඇවිදින් කතා කරනවා

මේ පොඩි බස්රිය ඔබේ ය සිතලා
කුරුටු ගෑම හොඳ නෑ ඉරි ඇඳලා
අසුන් කඩා බිඳ දමා නොයන්නේ
අපේය මේ බස්රිය රැක ගන්නේ

දෙබර මුලක් ගල් වැදී සැලෙන සේ
එපා පුංචි ළමයිනි පොර කන්නට
පේළි ගැසී බසයට නැග ගත් විට
මුතු ඇමුණුව වාගේ මුතු පොටකට

පද රචනය : ගාමිණී විජේතුංග

---

කළුමාමගෙ බයිසිකලේ
ට්‍රිලිං ට්‍රිලිං ට්‍රිලිං

කළු මාමා දර අදිනවා
බයිසිකලේ හති අරිනවා
රත්තිගෙ කිරිටික අරගෙන
කළු මාමා කිරි බෙදනවා

කළුමාමගෙ බයිසිකලේ
ට්‍රිලිං ට්‍රිලිං ට්‍රිලිං

පද රචනය : ජයන්ති මාලා ධර්මලතා

---

අතින් අත බැඳ පෙළ
නොයන් මං මාවත්වල
තැනින් තැන කඩවල
නොයන් කරුණක් නැතිව කිසි කළ

පාරෙ යන එන විට
අයින් වීමෙන් දකුණට
දුවපැන දඟ නොකොට
ගමන් කළ යුතු ය කී හැම විට

සිරිත් මල්දම

- **ගමනාගමනය සඳහා මාර්ග භාවිතයේ දී අප භාවිත කරන විවිධ ගමන් විලාස.**
  - සාමාන්‍ය ගමන
  - හෙමින් යාම
  - හයියෙන් යාම
  - කකුලේ ආබාධයක් සහිත අවස්ථාවල දී ඇවිද යාම
  - යටිපතුලේ යමක් ඇනුණ අවසථාවක දී ඇවිද යාම
  - සතුටු සාමීචියේ යෙදෙමින් නිදහසේ ගමන් කිරීම

- **ඉහත ගමන් විලාස අනුගමනය කරමින් ගමන් කර අපේ ගමන් විලාස වෙනස් වන ආකාරය අත්විඳින්න.**

- **වාහනවල චලන ආශ්‍රිත ක්‍රියාකාරකම**
  - ඔබේ මිදුලේ සීමාවක් ලකුණු කර ගන්න.
  - මැද කෙනෙක් සිටගෙන ඉලක්කමක් ලියන්න.
  - එම ඉලක්කමට අදාළ පෙට්ටි සංඛ්‍යාවකින් යුත් දුම්රියක් එකිනෙකාගේ උරහිස් මත අත් තබමින් සාදන්න.
  - නැවත නැවතත් පෙට්ටි ගණන මාරු කර දුම්රිය සාදන්න.